කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ
மண்டல கல்வி அலுவலகம் - மினுவாங்கொட
Zonal Education Office - Minuwangoda

# 11 ශ්‍රේණිය

# කතෝලික ධර්මය



# 2 වන නිපුණතාවය
# ත්‍රිත්වික දෙවියන් වහන්සේ

| සුවෙන් පෙරට<br>e ඉගෙනුම් පියස<br>මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය | ZEOM<br>කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ<br>மண்டல கல்வி அலுவலகம் - மினுவாங்கொட<br>Zonal Education Office - Minuwangoda | |
|---|---|---|
| 2 වන නිපුණතාවය - ත්‍රිත්වික දෙවියන් වහන්සේ | | |
| ශ්‍රේණිය : 11 | විෂයය : කතෝලික ධර්මය | පාඩම : 5 පාඩම - මැවීම |

1. ශුද්ධ බයිබලයේ මැවීමේ කතා තුළින් ඉදිරිපත් කරන්නේ කුමක්ද?
2. ලෝකයේ ආරම්භය හා පැවැත්ම පිළිබඳ විවිධ මත නැතහොත් න්‍යායන් 3ක් නම් කරන්න
3. උත්පත්ති පොතේ මුල් පරිච්ඡේද 11 හදුවන නම කුමක්ද?
4. උත්පත්ති පොතේ මුල් පරිච්ඡේද 11 තුළ ඉදිරිපත් කරන උපමා කතා තුළින් බයිබල් කතුවරයා බලාපොරොත්තු වන්නේ මොනවාද?
5. උත්පත්ති පොතේ ප්‍රාග් ඉතිහාස කතා තුළින් දැක්වෙන දේව ධාර්මික පණිවිඩය කුමක්ද?
6. උත්පත්ති පොතේ මැවීම පිළිබඳ ඉදිරිපත් කරන කතා පුවත් 2 නම් කරන්න

**පළමු මැවීමේ කතාව** ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න

7. ඉදිරිපත් වී ඇති සම්ප්‍රදාය කුමක්ද?
8. පළමු මැවීමේ කතාව ඉදිරිපත් කරන කතුවරයාගේ අරමුණ කුමක්ද?
9. පළමු මැවීමේ කතාව ඉදිරිපත් වන දේව ධාර්මික පණිවිඩය ලියන්න.
10. පළමු මැවීමේ කතාව තුළ දෙවියන් වහන්සේ මිනිසාව මවා ඇත්තේ කෙසේද?
11. මිනිසා අන් සියලු මැවිලි වලට වඩා උතුම් වීමට හේතු වන කරුණු තුන ලියන්න

**දෙවන මැවීමේ කතාව** ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න

12. දෙවන මැවීමේ කතාව ඉදිරිපත් වී ඇති සම්ප්‍රදාය කුමක්ද?
13. දෙවන මැවීමේ කතාවේදී දෙවියන් වහන්සේ හා මිනිසා අතර ඇති සම්බන්ධතාව හා මිනිසාගේ උතුම් බව දැක්වෙන ලක්ෂණය කුමක්ද?
14. දෙවන මැවීමේ කතාවට අනුව මිනිසාව හා ස්ත්‍රියව මවනු ලබන්නේ කෙසේද?
15. ස්ත්‍රියව මිනිසාගේ හදවතට සම්බන්ධ ඉල ඇටයකින් මැවීම තුළින් අදහස් වන්නේ කුමක්ද?
16. දෙවන මැවීමේ කතාව තුළ පුර්ෂයා හා ස්ත්‍රිය අතර සබඳතාව දක්වන කරුණු 4ක් ලියන්න

සුවෙන් පෙරට
e ඉගෙනුම් පියස
මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

ZEOM
කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ
மண்டல கல்வி அலுவலகம் - மினுவாங்கொட
Zonal Education Office - Minuwangoda

| 2 වන නිපුණතාවය - ත්‍රිත්වික දෙවියන් වහන්සේ | | |
|---|---|---|
| ශ්‍රේණිය : 11 | විෂයය : කතෝලික ධර්මය | පාඩම : 6 පාඩම - මිනිසා පාපයට වැටීම |

1. උත්පත්ති 3 පරිච්ඡේදය තුළ සර්පයාගෙන් සංකේතවත් කරන්නේ කුමක්ද?
2. ස්ත්‍රියගේ රුචිය කතා කළ ආකාර තුන ලියන්න
3. ආදම් හා ඒවව ඒදන් උයනේ පදිංචි කළ දෙවියන් වහන්සේ ඔවුන්ට දුන් අවවාදය ලියන්න.
4. ආදම් හා ඒව පාපයට වැටීමට බලපෑ හේතුව ලියන්න
5. කායින් තම සහෝදරයාව මරා දැමීමට බලපෑ හේතුව ලියන්න
6. ආදිමව්පියන්ගෙන් හා කායින්ගෙන් දෙවියන් වහන්සේ ප්‍රශ්න කළ විට ඔවුන් දුන් පිළිතුරු වලින් දිස්වන කරුණ කුමක්ද?
7. වදට වැටුණ ආදිමව්පියන්ට හා කායින්ට දෙවියන් වහන්සේ දුන් දඬුවම් තුන බැගින් ලියන්න
8. ප්‍රේමයෙන් දඬුවම් දුන් දෙවියන් වහන්සේ ගැලවුම්කරුවකු එවීමට ආදම් හා ඒවට දුන් පොරොන්දුව දැක්වෙන බයිබල් පාඨය ලියන්න(උත්පත්ති 3:15)
9. අත්තික්කා කොළ ඇද සිටි මිනිසාට දෙවියන් වහන්සේ හම් වස්ත්‍ර සාදා දීමෙන් පෙන්නුම් කරන්නේ කුමක්ද?
10. අපට නිවැරදි මග යාමට අවවාද කරන මාර්ග 4 ක් ලියන්න

නෝවා

11. නෝවාගේ කාලය වන විට මිහිපිටින් මිනිසා ඉවත් කිරීමට හේතුව ලෙස බයිබල් කතුවරයා පෙන්වා දෙන කාරණය කුමක්ද?
12. නව මැවිල්ලේ ආරම්භකයා වන්නේ කවුද?
13. නෝවාව දෙවියන් වහන්සේ විසින් තෝරාගැනීමට බලපෑ හේතු තුන ලියන්න
14. නෝවා මෙන් ධර්මිෂ්ඨ ජීවිතයක් ගත කිරීමට ඔබ ජීවිත තුළ ගොඩනගා ගත යුතු ගුණාංග 5 ක් ලියන්න
15. අද සමාජය තුළ වර්ධනය වී ඇති පාපී ක්‍රියා 5 ක් නම්කර ඒවා ජය ගැනීමට කළයුතු දේ විස්තර කරන්න

| සුවෙන් පෙරට<br>e ඉගෙනුම් පියස<br>මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය | ZEOM<br>කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ<br>மண்டல கல்வி அலுவலகம் - மினுவாங்கொட<br>Zonal Education Office - Minuwangoda |
|---|---|

2 වන නිපුණතාවය - ත්‍රිත්වික දෙවියන් වහන්සේ

| ශ්‍රේණිය : 11 | විෂයය : කතෝලික ධර්මය | පාඩම : 7 පාඩම - නික්මයාම |
|---|---|---|

1. ආදිපියවරු තිදෙනාගේ නම් ලියන්න
2. ජාකොබ්ගේ පුතුන් 12 දෙනාගේ නම් ලියන්න
3. ආබ්‍රහම් තුමාගේ පෙළපත මිසරයේ වර්ධනය වූයේ කවුරුන්ගේ අනුග්‍රහයෙන්ද?
4. කාලයක් ගත වූ පසු " ජෝශප් ගැන කිසිවක් නොදත් රජෙකු" මිසරයේ රජ වූ පසු ඉශ්‍රායෙල් ජනතාවගේ වර්ධනය මර්දනය කිරීමට ගත් පියවර තුන නම් කරන්න
5. ඉශ්‍රායෙල් ජනතාවට මිසරයෙ දී ගොඩනගන්නට සිදු වූ නගර දෙක නම් ක රන්න
6. ඉශ්‍රායෙල් ජනතාව මිසරයේදී කළ කර්මාන්ත තුන නම් කරන්න
7. නොදැවෙන පඳුරක් තුළින් දර්ශනය වෙමින් දෙවියන් වහන්සේ කැඳවූයේ කවුරුන්වද?
8. මෝසෙස් තුමාව කැඳවූ දෙවියන් වහන්සේ ඔහුට දුන් වගකීම කුමක්ද?
9. දෙවියන් වහන්සේ මෝසෙස් තුමාව දිරිමත් කරමින් වදාළ වචන මොනවාද?
10. පාරාවෝ රජු සිත දැඩි කරගෙන ක්‍රියා කළ නිසා ඔහුට හා මිසර වැසියන්ට විඳින්නට සිදුවූ වසංගත 10 අනු පිළිවෙලින් නම් කරන්න (වමැකිමැසි ගවගඩුගල් පළගනකුළු)
11. පාරාවො රජු ඉශ්‍රායෙල් ජනතාවට පිටත් වීමට අවසර දෙන්නේ කුමන වසංගතයෙන් පසුද?
12. මිනිසාට දෙවිසමිඳුන්ගේ ආදරය හා රැකවරණය විදහා පෑමට ස්වභාව ධර්මය හරහා සිදුවූ ක්‍රියාවන් 6ක් ලියන්න
13. ප්‍රසාද ස්නාපනය තුළින් දේව දරුවන් වූ අපව විවිධ වූ පාපයේ වහල්කම් වලින් මුදාගෙන දේව රාජ්‍යය නම් වූ පොරොන්දු දේශය කරා ගෙන යාමේ වගකීම පැවරී ඇත්තේ කාටද?
14. ප්‍රසාද ස්නාපනය තුළ ශුද්ධ වූ සභාවේ සාමාජිකයන් වූ අපට පාපයේ වැටී සිටින අන් අය වෙනුවෙන් ඇති හා අප වෙනුවෙන් ඇති වගකීම කුමක්ද?
15. නික්මයාම ගමනේදී දෙවියන් වහන්සේ ඉශ්‍රායෙල් ජනතාවට රැකවරණය දුන්නාසේ ඔබගේ ජීවිත ගමනේදී ඔබ දෙවියන් වහන්සේගේ රැකවරණය හෙවත් දිව්‍ය සංරක්ෂණය ලද අවස්ථා 5 ක් ලියන්න
16. දෙවියන් වහන්සේ අපව සුරකින බව අත්දැකීමට අප තුළ තිබිය යුතු ගුණාංගය කුමක්ද?
17. ක්‍රියා විරහිත ඇදහිල්ල මළ ඇදහිල්ලක් බව දක්වන බයිබලීය ග්‍රන්ථය කුමක්ද?

| | | |
|---|---|---|
| **සුවෙන් පෙරට**<br>**e ඉගෙනුම් පියස**<br>**මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** | | ZEOM කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ<br>மண்டல கல்வி அலுவலகம் - மினுவாங்கொட<br>Zonal Education Office - Minuwangoda |
| 2 වන නිපුණතාවය - ත්‍රිත්වික දෙවියන් වහන්සේ | | |
| ශ්‍රේණිය : 11 | **විෂයය : කතෝලික ධර්මය** | **පාඩම : 8 පාඩම - සීනයි ගිවිසුම** |

1. සාමාන්‍ය සමාජයේ ගිවිසුම් වලට වඩා දෙවියන් වහන්සේත් මිනිසාත් අතර ඇතිවන ගිවිසුම් වල ඇති වෙනස්කම් තුන ලියන්න
2. දෙවියන් වහන්සේත් මිනිසාත් අතර ඇතිවූ ගිවිසුම් 4 ක් නම් කරන්න

**<u>ආදිමව්පියන් සමග ගිවිසුම</u>**

3. දෙවියන් වහන්සේ ආදි මව්පියන් සමග ගිවිසුමක් ඇති කරගැනීමට හේතුව කුමක්ද?
4. දෙවියන් වහන්සේ ආදිමව්පියන් සමග ඇති කරගත් ගිවිසුමේ පොරොන්දුව ලියන්න(උත්3:15)
5. දෙවියන් වහන්සේ ආදිමව්පියන් සමග කළ ගිවිසුම සඵල වූයේ කවුරුන් මගින්ද?

**<u>නෝවා සමග ගිවිසුම</u>**

6. ආදිමව්පියන්ගේ පටන් ගත් පාපය වර්ධනය වීම නිසා ජල ගැල්මකින් ලෝකය විනාශ කළ පසු නෝවා සමග ඇත් කර ගත් ගිවිසුමේ පොරොන්දුව වූයේ කුමක්ද?
7. දෙවියන් වහන්සේ නෝවා සමග ඇතිකර ගත් ගිවිසුමේ බාහිර සළකුණ කුමක්ද?

**<u>ආබ්‍රහම් සමග ගිවිසුම</u>**

8. දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමග ඇතිකර ගත් ගිවිසුම ඉදිරිපත් කර ඇති සම්ප්‍රදායන් 2කුමක්ද?
9. දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමග කළ ගිවිසුමේ ප්‍රධාන කරුණු 2 ලියන්න
10. දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමග ඇති කර ගත් ගිවිසුමේ බාහිර සළකුණ කුමක්ද?

**<u>සීනයි ගිවිසුම</u>**

11. සාමාන්‍ය එඬේරික ජීවිතයක් ගත කළ ඉශ්‍රායෙල් ජනතාව සුවිශේෂී දේව ජනතාවක් බවට පත්වූයේ කුමන ගිවිසුම මගින්ද?
12. සීනයි ගිවිසුවට එකග වීම සඳහා දුන් නීති පද්ධතිය කුමක්ද?
13. දස පනත නම් වූ මෙම නීති පද්දතිය තුළින් අපට පැහැදිලි කරන්නේ කුමක්ද?
14. දස පනත සර්ව කාලීන නීති පද්දතියක් වීමට හේතු 2ක් ලියන්න

15. අප දෙවියන් වහන්සේ සමග ගිවිසුමක් ඇති කර ගත්තේ කුමන අවස්ථාවේදීද?

16. ප්‍රසාද ස්නාපනයේදී දෙවියන් වහන්සෙ සමග ගිවිසුමකින් බැදුන අප උන්වහන්සේට වූ පොරොන්දු දෙක ලියන්න

17. ඔබ ප්‍රසාද ස්නාපනීය පොරොන්දු ඉටු කිරීම සඳහා කළ යුතු දේවල් 5 ක් ලියන්න

සුවෙන් පෙරට

**e ඉගෙනුම් පියස**

**මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය**

ZEOM
කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ
மண்டல கல்வி அலுவலகம் - மினுவாங்கொட
Zonal Education Office - Minuwangoda

2 වන නිපුණතාවය - ත්‍රිත්වික දෙවියන් වහන්සේ

| ශ්‍රේණිය : 11 | විෂයය : කතෝලික ධර්මය | පාඩම : 9 පාඩම - ස්නාවක ජුවාම් තුමා |
|---|---|---|

1. මලාකි දිවැසිවරයා ස්නාවක ජුවාම් තුමා පිළිබඳ ප්‍රකාශ කළ දිවැසි වැකිය ලියන්න
2. පැරණි ගිවිසුමේ සඳහන් පරිදි ස්නාවක ජුවාම් තුමාගේ වගකීම කුමක්ද?
3. පූජකයෙක් වූ ස්නාවක ජුවාම් තුමාගේ පියා වන සකරියස් තුමා දේව පණිවිඩය අවිශ්වාස කරමින් දුන් පිළිතුර ලියන්න
4. ගාබ්‍රියෙල් දේව දූතයා මරිය තුමියට මංගලම් කී අවස්ථාවේ එළිසබෙත් තුමිය පිළිබඳ දුන් පණිවිඩය ලියන්න



5. ගාබ්‍රියෙල් දේව දූතයා ස්නාවක ජුවාම් තුමා ගැන සකරියස් තුමාට දැන්වූ කරුණු 3 ලියන්න (ලූක් 1:15)
6. ස්නාවක ජුවාම් තුමා ජම්ම පාප දෝෂයෙන් නිදොස් වූයේ කුමන අවස්ථාවේදීද
7. ස්නාවක ජුවාම් තුමාට පැවරුන දේව කාර්ය කුමක්ද?
8. එම දූත කාර්ය එතුමා ආරම්භ කළ ස්ථානය කුමක්ද?
9. "එම්බා පොළොං වංශය " කියා ස්නාවක ජුවාම් තුමා ඇමතුවේ කාටද?
10. ප්‍රසාද ස්නාපනය ලැබූ අපටද ගැලවීම ලැබීමට නම් කළ යුතු දෙය වන්නේ මොනවාද?
11. ස්නාවක ජුවාම් තුමාගේ දේශනා යොමු වූ ජන කොටස් තුන නම් කරන්න
12. එම ජන කොටස් වලට ලැබුන පණිවිඩය වෙන වෙනම ලියන්න. එමගින් අපට ලැබෙන පණිවිඩයද දක්වන්න
13. එදා ස්නාවක ජුවාම් තුමාගේ නව සමාජ ධර්මය තුළ ඉදිරිපත් කරන ගුණාංග 5ක් ලියන්න
14. ජේසුස් වහන්සේගේ දෙවන පැමිණීමට ජනතාව සූදානම් කිරීමේ වගකීම පැවරි ඇත්තේ කාටද?
15. ස්නාවක ජුවාම් තුමාගේ මරණයට ප්‍රධාන හේතුව ලියන්න
16. ප්‍රසාද ස්නාපනයේදී ඔබ ලද දිවැසි කැඳවීමට අනුව ඔබ එම කැඳවීමට සාක්ෂි දැරිය හැකි අවස්ථා 5ක් ලියන්න

| සුවෙන් පෙරට<br>e ඉගෙනුම් පියස<br>මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය | | කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ<br>Zonal Education Office - Minuwangoda |
|---|---|---|
| 2 වන නිපුණතාවය - ත්‍රිත්වික දෙවියන් වහන්සේ | | |
| ශ්‍රේණිය : 11 | විෂයය : කතෝලික ධර්මය | පාඩම : 10 පාඩම - ජේසුස් වහන්සේගේ දූත මෙහෙවර |



1. ජේසුස් වහන්සේගේ ප්‍රසිද්ධ ජීවිතය හා දූත මෙහෙවර ආරම්භ වන අවස්ථාව කුමක්ද
2. ජේසුස් වහන්සේගේ බව්තීස්ම අවස්ථාවෙදී වූ සිදුවීම් 2 ක් ලියන්න
3. ජේසුස් වහන්සේ බව්තීස්මයෙන් පසු දෙවියන් වහන්සේ හා ගැඹුරු සංවාදයක් සඳහා පාළුකරයට යාමේ අරමුණ කුමක්ද?
4. පාළුකරයේදී ජේසුස් වහන්සේ මුහුණ දුන් පරීක්ෂා තුන නම් කර ඒ සඳහා ජේසුස් වහන්සේ දුන් පිළිතුරු එම එක් එක් පරීක්ෂාවට ඉදිරියෙන් ලියන්න
5. එම පරීක්ෂා තුනෙන් අපට ලැබෙන පණිවිඩ තුනක් ලියන්න
6. පරීක්ෂා ජයගෙන නාසරෙත් ධර්මශාලාවට පැමිණි ජේසුස් වහන්සේ යෙසායා දිවැසිවරයාගේ ග්‍රන්ථය පෙරලා කියවූ පාඨය ලියන්න
7. ඒ අනුව ජේසුස් වහන්සේගේ දූත කාර්යයේ අරමුණ ලියන්න

**ප්‍රාතිහාර්ය**

8. ශු. අගුස්තීනු තුමාට අනුව ප්‍රාතිහාරයක් යනු කුමක්ද?
9. ජේසුස් වහන්සේ සිදුකළ ප්‍රාතිහාර්ය වර්ග 4 උදාහරණ සහිතව ලියන්න
10. ජේසුස් වහන්සේ සිදුකල ප්‍රාතිහාර්ය මගින් ප්‍රකාශ වන කරුණු 5 ක් ලියන්න
11. ප්‍රාතිහාරයක් සිදුවීමට ඇදහිල්ල බලපාන අතර ඇදහිල්ලේ වාතාවරණයක් තුළ සිදුවූ ප්‍රාතිහාර්ය 2ක් නම් කර ජේසුස් වහන්සේ එම අවස්ථාවලදී වදාළ වචන ලියන්න
12. අපගේ ජීවිත තුලද ප්‍රාතිහාර්ය අත්දැකීමට නම් කළ යුත්තේ මොනවාද?

**හැත්තෑ දෙනාගේ ධර්මදූත සේවය**

13. ලූක් තුමා පමණක් සඳහන් කරන 70 දෙනාගේ ධර්මදූත සේවය පිළිබඳ විස්තරයේ විශාරද මතය අනුව 70 දෙනෙකු ලෙස අදහස් කරන්නේ කුමක්ද?
14. හැත්තෑදෙනා ධර්මදූත සේවය සඳහා පිටත් කර හැරීමේදී ජේසුස් වහන්සේ ඔවුනට දුන් අවවාද 3ක් ලියන්න(ලූක් 10:1-9 හි පසුම්බියක් හෝ ...යන තැන සිට බලන්න)
15. ශුද්ධ වූ සභා මාතාවගේ දරුවන් වන අප ප්‍රසාද ස්නාපනය තුළ ලොවට ශුභාරංචිය ගෙන යාමට කළ හැකි දේවල් 3 ක් ලියන්න

සුවෙන් පෙරට

**e ඉගෙනුම් පියස**

**මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය**

කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ
மண்டல கல்வி அலுவலகம் - மினுவாங்கொட
Zonal Education Office - Minuwangoda

| 2 වන නිපුණතාවය - ත්‍රිත්වික දෙවියන් වහන්සේ | | |
|---|---|---|
| ශ්‍රේණිය : 11 | විෂයය : කතෝලික ධර්මය | පාඩම : 11 පාඩම - දේව රාජ්‍යය |

1. දේව රාජ්‍යය යනු කුමක්ද?
2. ජේසුස් වහන්සේගේ වචන හා ක්‍රියාවන්ගේ හරය කුමක්ද?
3. අපට දේව රාජ්‍යයේ උදාව අත් දැකිය හැක්කේ කෙසේද?
4. ක.ස.ධ. අනුව ස්වර්ගයේ ජීවත් වීම යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?



**උපමා**

5. ජේසුස් වහන්සේ දේව රාජ්‍යයේ වටිනාකම් පිළිබඳ වදාළ උපමා 7 ක් නම් කරන්න
6. දේව රාජ්‍ය පිළිබඳ පැහැදිලි කරන එම උපමා කෙටියෙන් ලියන්න
7. වපුරන්නාගේ උපමාව මගින් ලැබෙන පණිවිඩය දක්වන්න

**කන්ද උඩ දේශනාව**




8. කන්ද උඩ දේශනාව මගින් ජේසුස් වහන්සේ උගන්වන්නේ මොනවාද?
9. මතෙව් 5,6,7 පරිච්ඡේද වල සඳහන් කන්ද උඩ දේශනාවේ අන්තර්ගත ඉගැන්වීම් 12 ක් නම් කරන්න
10. එම ඉගැන්වීම් අතරින් දෙකක් කෙටියෙන් පැහැදිලි කර ඉන් ලැබෙන පණිවිඩය ලියන්න
11. භාග්‍ය අට තුළින් දැක්වෙන දේව රාජ්‍යයේ වටිනාකම් 8ක් ලියන්න
12. දේව රාජ්‍යයේ වටිනාකම් දැක්වෙන ශ්‍රී ලංකාවේ පවතින සාරධර්ම 5ක් නමකරන්න